**වැදගත්:**

**ඔබේ අවබෝධයේ පහසුව සඳහා පමණක් සිංහල අයදුම් පත මෙලෙස ඉදිරිපත් කෙරේ. ඔබ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව වෙත සම්පූර්ණ කර ඉරිපත්කළ යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් යුක්ත අයදුම්පතයි.**

# අයදුම්පත්‍රය

*(ඔබගේ ආයතනයේ නිල ලිපි ශීර්ෂය මත මුද්‍රණය කළ යුතුය)*

**වෙත:**
සභාපතිතුමා
ශ්‍රී ලංකා ජාතික ඔස්කාර් තේරීම් කමිටුව (NOSCSL)
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව (NFC)
තැ.පෙ. 88, අංක 303, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07, ශ්‍රී ලංකාව

පහත විස්තර කර ඇති චිත්‍රපටය, ශ්‍රී ලංකාවේ නිල නියෝජනය ලෙසින් 99 වැනි ඇකඩමි සම්මාන උළෙලේ අන්තර්ජාතික වෘත්තාන්ත චිත්‍රපට කාණ්ඩය සඳහා යොමු කිරීම වෙනුවෙන් සලකා බැලීම සඳහා අපි මෙලෙස ඉදිරිපත් කරමු.

සුදුසුකම් සපුරන්නා වූ සියලුම අයදුම්පත් ශ්‍රී ලංකා ජාතික ඔස්කාර් නිළ තේරීම් කමිටුව (NOSCSL) විසින් සමාලෝචනය කොට ඇගයීමට ලක් කරනු ලබන බවටත්, 99 වෙනි ඇකඩමි සම්මාන උළෙලේ ශ්‍රී ලාංකේය නිල නියෝජනය ලෙස තෝරාගනු ලබන චිත්‍රපටය තීරණය කරනු ලබන්නේ එම කමිටුව විසින් බවත් අපි පිළිගනිමු. තවදුරටත්, කමිටුව ලබා දෙන තීරණය අවසන් තීරණය බවත්, එම තීරණය පිළිගැනීමට අපි බැඳී සිටින බවටත් පිළිගනිමු. එසේම එම තීරණයට කිසිඳු විරෝධතාවයක්, අභියාචනයක් හෝ තර්ක කිරීමක් ඉදිරිපත් නොකට එම තීරණය පිළිගෙන ඒ අනුව කටයුතු කිරීමට එකඟ වෙමු.

- චිත්‍රපටයේ මුල් නාමය:
- චිත්‍රපටයේ ඉංග්‍රීසි භාෂිත නාමය:
- චිත්‍රපටයේ අන්තර්ගත මුල් භාෂාව:
- චිත්‍රපටයේ ධාවන කාලය (මිනිත්තු වලින්):
- චිත්‍රපටයේ නිෂ්පාදන කටයුතු සම්පූර්ණයෙන්ම නිමා කළ දිනය:
- චිත්‍රපටය ශ්‍රී ලංකාවේ තිරගත කිරීම ආරම්භ කළ දිනය:
- චිත්‍රපටය ශ්‍රී ලංකාව තුළ තිරගත කිරීම අවසන් කළ දිනය (චිත්‍රපටය මේ මොහොතවන විට තිරගත නොවේනම්):
- චිත්‍රපටයේ ප්‍රදර්ශකයාගේ නම:
- රූපගත කිරීමේ අකෘතිය:
- රූපගත කිරීම් සඳහා යොදාගත් කැමරා වර්ගය:
- ශබ්ද මාදිලිය:
- රාමු වේගය:
- දර්ශන අනුපාතය:
- වර්ණයේ ස්භාවය:
- අධ්‍යක්ෂක:

- තිර රචක:
- සංස්කාරක:
- කැමරා අධ්‍යක්ෂක:
- සංගීත අධ්‍යක්ෂක:
- ශබ්ද සැලසුම් ශිල්පී:
- නිෂ්පාදකගේ / නිෂ්පාදන සමාගමේ නම:
- තැපැල් ලිපිනය:
- විද්‍යුත් ලිපිනය (ඊ-මේල්):
- දුරකථන අංක:
- වෙබ් අඩවි ලිපිනය (ඇත්නම් පමණක්):

**ප්‍රකාශය:**

නියම කර ඇති ආපසු ගෙවනු නොලබන රුපියල් 200,000 ක (ශ්‍රී ලංකා රුපියල් දෙලක්ෂයක) ඉදිරිපත් කිරීමේ ගාස්තුව පහත සඳහන් බැංකු ගිණුමට ගෙවා ඇති බව මම/අපි මෙයින් ප්‍රකාශ කර තහවුරු කරමි/මු. එසේම තවදුරටත් මෙම ඉදිරිපත් කිරීමේ ගාස්තුව කිසිඳු අවස්ථාවක් යටතේ ආපසු ගෙවන ලෙස ඉල්ලා සිටීමට, ඒ සඳහා හිමිකම් පෑමට හෝ එම මුදල ආපසු ලබා ගැනීමට මා හට/ අප හට හිමිකමක් නොමැති බව මම/අපි පිළිගෙන එකඟ වෙමි/වෙමු.

- ගිණුමේ නම : ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
- ගිණුම් අංකය : 0002323272
- බැංකුවේ නම : ලංකා බැංකුව
- බැංකු ශාඛාවේ නම : ටොරින්ටන්

මම/අපි තවදුරටත් මෙයින් ප්‍රකාශ කර තහවුරු කරන්නේ, මෙම අයදුම්පත සමග ඉදිරිපත් කොට ඇති සියලුම තොරතුරු, උපකාරක ලිපි ලේඛන සහ අනෙකුත් අයිතම, මාගේ/අපගේ දැනුම හා විශ්වාසය අනුව, සත්‍ය, නිවැරැදි හා සම්පූර්ණ තොරතුරු බවයි.

මෙම අයදුම්පත සමග ඉදිරිපත් කොට ඇති යම් තොරතුරක්, උපකාරක ලේඛනයක් හෝ ඉදිරිපත් කිරීමේ අයිතමයක් සාවද්‍ය, නොමඟ යවනසුලු, නිවැරැදි නොවන, අසම්පූර්ණ හා වංචනික බවකින් යුක්ත බවට අනාවරණය වුවහොත්, එය සුදුසුකම් නොලබන්නාවූ ඉදිරිපත් කිරීමක් සේ සලකනු ලබන බවටත්, එය ශ්‍රී ලංකා ජාතික ඔස්කාර් තේරීම් කමිටුවේ සලකා බැලීම සඳහා නුසුදුසු වන බවටත් මම/අපි මෙයින් අවබෝධ කරගෙන පිළිගනිමි/මු. එවැනි යම් විෂමතාවයක්, සාවද්‍ය නිරූපණයක් හෝ අක්‍රමිකතාවයක් අනාවරණය වුවහොත්, තේරීම් ක්‍රියාවලියේ ඕනෑම අදියරකදී එම ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ නුසුදුස්සෙකු බවට පත්කිරීමට තේරීම් කමිටුවට අයිතිය සතුබව මම/අපි තවදුරටත් පිළිගෙන එකඟ වෙමි/වෙමු.

අත්සන:

බලයලත් අත්සන්කරුගේ නම:
ජාතික හැඳුනුම්පතේ අංකය හෝ විදේශ ගමන් බලපත්‍රයේ අංකය:
දුරකථන අංකය:
දිනය:
සමාගමේ නිල මුද්‍රාව:

# <u>ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන / අයිතම</u>
## (සියලුම ලිපි ලේඛන ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කිරීම අනිවාර්‍ය වේ)

- ✓ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය. චිත්‍රපටයේ හිමිකාරිත්වය හෝ අයිතිය දරන තැනැත්තා හෝ තැනැත්තන් විසින් අත්සන් කොට තිබිය යුතුය.

- ✓ නිෂ්පාදක/යින් සහ/හෝ නිෂ්පාදන සමාගම/ම් අතර අත්සන් කරන ලද මුදල් ආයෝජන ගිවිසුමේ සහතික කරන ලද පිටපතක්.

- ✓ චිත්‍රපටයේ නිෂ්පාදකගේ/යින්ගේ විදේශ ගමන් බලපත්‍රයේ හෝ ජාතික හැඳුනුම්පතේ (ජාතික හැඳුනුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත්කොට තිබිය යුතු අතර, එසේ නොමැතිනම් දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු ලවා ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලද්දක් විය යුතුය) සහතික කරන ලද පිටපතක්. නිෂ්පාදන සමාගමක් නම් එම සමාගමේ සංස්ථාපනය කිරීමේ සහතිකයේ/ තනි පුද්ගල ව්‍යාපාරයක් නම්, එම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද පිටපතක්.

- ✓ චිත්‍රපටයේ මූල්‍ය හිමිකාරිත්වයෙන් බහුතර ප්‍රමාණයක් (ප්‍රතිශතයක් ලෙස) ශ්‍රී ලාංකේය පුරවැසියන්, ශ්‍රී ලාංකේය පදිංචිකරුවන්, ශ්‍රී ලංකාවේ සරණාගත හෝ නීතිමය රැකවරණය හිමි පුද්ගලයන් සහ/හෝ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කොට ඇති සමාගමක් හෝ ව්‍යාපාරයක් සතුවන බවට තහවුරු කෙරෙන දිවුරුම් ප්‍රකාශයක්.

- ✓ චිත්‍රපටයේ කතා සාරාංශය
  - කෙටි සාරාංශය- උපරිම <u>අකුරු</u> 300
  - දීර්ඝ සාරාංශය- උපරිම වචන 200

- ✓ චිත්‍රපටයේ කතා සාරාංශ පාඨය (ලොග් ලයින්)- උපරිම <u>අකුරු</u> 200/ චිත්‍රපටයේ ප්‍රචාරක පාඨය (ටැග් ලයින්)

- ✓ චිත්‍රපටයේ අධ්‍යක්ෂකවරයාගේ චරිතාපදානය (උපරිම වචන 100)

- ✓ අධ්‍යක්ෂකවරයාගේ චිත්‍රපට නාමාවලිය (කුමන හෝ මාධ්‍යකින් මේ දක්වා ප්‍රදර්ශනය කොට ඇති කෙටි චිත්‍රපට, වාර්තා චිත්‍රපට, දීර්ඝ වෘත්තාන්ත චිත්‍රපට නාමාවලිය- ප්‍රදර්ශනය කළ වසර සමග)

- ✓ චිත්‍රපටයේ අධ්‍යක්ෂකවරයාගේ ප්‍රකාශය (උපරිම වචන 100)

- ✓ චිත්‍රපටයේ අධ්‍යක්ෂකවරයාගේ ඡායාරූප ( 1080px W X 1920px H (සිරස්)/ 1920px W X 1080px H (තිරස්)

- ✓ චිත්‍රපටයේ අධ්‍යක්ෂකවරයාගේ විද්‍යුත් ලිපිනය, පදිංචි ස්ථානයේ ලිපිනය, දුරකථන අංකය, වට්ස්ඇප් අංකය

- ✓ චිත්‍රපටයේ ආරම්භක නාමාවලියේ සහ අවසන් නාමාවලියේ දිස්වෙන පරිදි රංගන ශිල්ප-ශිල්පිනියන්ගේ සහ කාර්මික ශිල්ප-ශිල්පිනියන්ගේ සම්පූර්ණ නාම ලේඛනය

- ✓ චිත්‍රපටයේ ප්‍රධාන කාර්මික ශිල්ප-ශිල්පිනියන්ගේ සහ චිත්‍රපටයේ ප්‍රධාන/ සහාය රංගන ශිල්ප-ශිල්පිනියන්ගේ පුරවැසිභාවය තහවුරුකරනු වස් , අදාළ පුද්ගලයන්ගේ විදේශ ගමන් බලපත්‍රයේ හෝ ජාතික හැඳුනුම්පතේ පිටපතක් (ජාතික හැඳුනුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත්කොට තිබිය යුතු අතර, එසේ නොමැතිනම් දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු ලවා ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලද්දක් විය යුතුය)

- ✓ මුරපදයක් යෙදූ, ඉංග්‍රීසි උපැසිරැසි සහිත චිත්‍රපටයේ ආරක්ෂිත මාර්ගගත ප්‍රදර්ශන සබැඳියක්. අවශ්‍ය අවස්ථාවකදී ඉංග්‍රීසි උපැසිරැසි යෙදූ ඩී.සී.පී පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

- ✓ ඉංග්‍රීසි උපැසිරැසි සහිත චිත්‍රපටයේ පූර්ව ප්‍රචාරක පටයේ බාගතහැකි සබැඳියක්.

- ✓ චිත්‍රපටයේ සම්පූර්ණ දෙබස් ලැයිස්තුව, කාල කේත සමග ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉදිරිපත් කළ යුතුය ( තනි මයික්‍රෝසොෆ්ට් වර්ඩ් ගොනුවක ඉදිරිපත් කළ යුතුය)

- ✓ චිත්‍රපටයේ සම්පූර්ණ උපැසිරැසි ගොනුව එස්.ආර්.ටී ස්වරූපයෙන් (තනි ගොනුවක් ලෙස ඉදිරිපත් කළ යුතුය)

- ✓ ඉහළ ගුණත්වයෙන් යුතු චිත්‍රපටයේ ඡායාරූප 5-7 ක අතර ප්‍රමාණයක් (කිසිඳු දෘශ්‍යමාන අකුරක්, අංකයක්, සංකේතයක් හෝ ලාංඡනයක් ඡායාරූප තුළ අන්තර්ගත නොවිය යුතුය)

- ✓ මාර්ගගත වේදිකාවල ප්‍රදර්ශනයට යෝග්‍යවන අයුරින් තිරස් අතර නිර්මාණය කරන ලද චිත්‍රපටයේ පෝස්ටරයක්. එහි චිත්‍රපටයේ නම හැර වෙනස් කිසිඳු දෙයක් සටහන් නොවිය යුතුය. (3840px (W) × 2160px (H)/ 96 dpi/ RGB (8-bits/channel)/ JPG format/ maximum file size of 1.5 MB)

- ✓ චිත්‍රපටය නිළ වශයෙන් නියෝජනය කළ අන්තර්ජාතික සිනමා උළෙල සහ එම උළෙලවලදී චිත්‍රපටය ලබාගත් සම්මාන පිළිබඳව සවිස්තරාත්මක ලැයිස්තුවක්.

- ✓ චිත්‍රපටයේ විද්‍යුත් මාධ්‍ය ප්‍රචාරණ කට්ටලය

- ✓ චිත්‍රපටය නිළ වශයෙන් සිනමාශාලා තුළ ප්‍රදර්ශනයක් වූ බවට තහවුරු කිරීම උදෙසා වූ ලිපි ලේඛන
  - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ චිත්‍රපටය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද පිටපතක් (මුල් සහතිකය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත්කොට තිබිය යුතු අතර, එසේ නොමැතිනම් දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු ලවා ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලද්දක් විය යුතුය)
  - ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය විසින් චිත්‍රපටයේ ප්‍රදර්ශනයට අවසර ලබා දෙමින් නිකුත් කළ සහතිකයේ සහතික කරන ලද පිටපතක් (මුල් සහතිකය ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත්කොට තිබිය යුතු අතර, එසේ නොමැතිනම් දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු ලවා ඉංග්‍රීසියට පරිවර්තනය කරන ලද්දක් විය යුතුය)
  - චිත්‍රපටයේ නිළ ප්‍රදර්ශකයා විසින් නිකුත් කළ ප්‍රදර්ශනය තහවුරු කිරීමේ ලිපිය. (ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වෙබ් අඩවියෙන් මෙම ලිපියේ ඉංග්‍රීසි අකෘති පත්‍රය බාගත කර ගත හැකිය)
  - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් නිකුත් කළ ප්‍රදර්ශනය තහවුරු කිරීමේ ලිපිය. (ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වෙබ් අඩවියෙන් මෙම ලිපියේ ඉංග්‍රීසි අකෘති පත්‍රය බාගත කර ගත හැකිය.)
  - දින පැහැදිලිව ප්‍රදර්ශනය වන පරිදි, චිත්‍රපටයට අදාළව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළ කළ ප්‍රසිද්ධ වෙළඳ දැන්වීම් හා පුවත්පත් ලිපිවල ස්කෑන් කරන ලද පිටපත්

- ✓ නැවත නොගෙවන අයදුම්කිරීමේ ගාස්තුව ගෙවූ බවට තහවුරු කෙරෙන බැංකු රිසිට්පත